34 වන පිටෙන්

මුර බල්ලන්, සමාජය ආදී වූ චරිත හා අවස්ථා අතර දෝලනය වූ චරිතයක සංකීර්ණත්වය ඕ හොඳින් වටහා ගත්තිය. චරිතාංග නිළියක සේ ස්වර්ණා තම රංගන චාරිකාවට අවතීර්ණ වන්නේ හංස විලක් මගින් යයි හැඟුණ ද, ඈ සිනමාව තුල සැබෑ ලගැහැනියඩ බවට ප්‍රක්ෂේපනය වන්නේ 1982 දී නිරගතවූ වසන්න ඔබේසේකර අධ්‍යක්ෂණය කල ලදඩයමල චිත්‍රපටයේ රන්මලිගේ භූමිකාව තුළ, ස්වර්ණා පළකළ විශිෂ්ට රංගන ප්‍රතිභාව තුලින් යයි පැහැදිලිව පෙනේ. මා විශ්වාස කරන්නේ බොහෝ නිළියන් චරිත රගපා බවයි. එහෙත් ස්වරණා රන්මලිට පණ පෙවීමට වඩා ඒ වෙනුවෙන් ආවේශ වුවා යයි නැවත හැරී බලනවිට මට සිතෙයි. ඇයගේ අනන්‍ය සංවාද මුද්‍රාහැරීමේ නිරායාස බව, මුහුණින් මතුකෙරෙන

සියුම් භාව ප්‍රකාශන, ස්වර්ණාගේ රූපණයෙහි විශිෂ්ට හා අගනා සම්පත් වේ. ලදැන්වත් මේ සෙල්ලම නවත්වමුදල ඇය තදින් මට කියයි. මම ඇයට ආදරය කරමි. රාත්‍රියේ අන්ධකාරය කළුවර නැත.

ඉන්ද්‍රා කාර යාර වන්ද * තුසිතයේ සුරගනාදෝ....
ඉන්ද්‍රා කාර යාර වන්ද * නාග ලොවේ කුමරියදෝ
...චන්ද්‍රිකා සිරිවර්ධන සහ කලාවතී කැරකි කැරකි ගයයි.

මා... ඇසුවේ නොදන්නා හින්දා
මේ සරදම් හොදයි දෝ.. මන්දා ...

ජෝති අප හඩවයි. විජේ ඊට උඩින් හිනාවෙයි.

යසපාලිත නිර්මාණයක් රස සාගරයක් වූ ඇංජානා චිත්‍රපටයේහි ඇය වාණිජ සිනමාවේ සුරගනද වූ බව මට සිතෙයි. දමිල වචන මාත්‍රාවකින් පටන් ගන්න එකම සිංහල චිත්‍රපටි පසුබිම් ගීතයට රගපා ඇත්තේ ස්වරණා යයි කීවොත් ඔබ විස්මිත්ත වනු ඇත. ගීතා මෙන්ම ස්වරණා ද නටන විදිය දැකුම්කලූය. කටින් කෙල හැලේ. ගලූර් ලොක්කා කැමරාව කරේ තියන් වටේ යයි. හැටන් * බගවන්තලාව පාර මොහොතකට රිදී තිමිනයක තුසිතයක් වෙයි. 80 දශකයේ සිනමා ශාලා සේවක ඇත්තෝ නැවතත් බොක්ස් ඔෆිස් පුවරුවල දුවිලි පිසදා තීන්ත ගායි.

"දෙවියන් වහන්සේ තමයි මාව බේරුවේ. මම දෙවියන් පිළිබඳ විශ්වාස තැබුවා. වෛද්‍යවරුන් නොවන්නට මට යළිත් උපදින්නට අවස්ථාව ලැබෙන්නේ නෑ. ඔවුන්ට මම ණයගැතියි. නමුත් මේ සියල්ල දරාගන්න මට ශක්තියක් වුණේ දෙවියන් කෙරෙහි මා තුළ තිබුණු විශ්වාසය. ඕනෑම කෙනෙක්ට හිතේ ශක්තිය තිබෙනවා නම් ඕනෑම දරුණු ලෙඩකට වුණත් මුහුණ දෙන්න පුළුවන්." මම සුවය ලබනවා කියන සිතිවිල්ලේ දැඩි ලෙස එල්බ සිටියා.

හංස නෙතක රැඳී
කඳුළක් ගිලිහී
හංස විලම කැළතේ
හංස විලම කැළතේ

"දැන්වත් මේ සෙල්ලම නවත්වමුද"
වර්තමානයේ ඇය යළිදු මට යෝජනා කරයි. මමද හංස විලට බැස්සෙමි. රැය පහන් වෙමින් පවතී

මොහොතකින් මගේ දෑස, ඈ පසුපස ගමන් කරයි. වසර 1999 දිනක ලයනල් වෙන්ඩිට් කලාගාරයට පිවිසේ. ධර්මසිරි බණ්ඩාරනායක නාට්‍ය උළෙල ක්‍රියාත්මකයි. ධවල හිෂණ එදින වේදිකා ගතවීමට නියමිතයි. කොරිඩෝව දිගේ යනවිට, ඇතුළු වේදිකා ප්‍රවිශ්ටය අසල ඩබ්ලිව් ජයසිරි, චරිතයට වෙස් ගන්වා බලා සිටී.

නිමේෂයකින්, "සුබ සන්ධ්‍යාවක් ආර්යාවෙනි" ජයසිරි අයියා සැලියුට් සමාචාරයක් පිරිනමයි. ඈ කොක් හඩලා සිනාවෙයි. ධර්මසිරි දක්නට නැත. නැවතත් මා ස්වර්ණා අසල තනිවී ඇත. මම ඇයට හෙටද ආදරේ කරමි. ඒ සඳහා වාණිජ ලංසුවක් වලංගු නැත.

"බල්ලන්ට දඩාවතේ යන්න දෙන්න බෑ. එක්කෝ උන් බැඳලා දාන්න ඕන. නැත්නම් මරලා දාන්න ඕන. මට පුළුවන් බල්ලව බැඳලා දාන එක විතරයි..." ඇය පුරුෂාධිපත්‍යයට එරෙහිව හුදකලා අරගලයක යෙදුණු ස්ත්‍රී පරමාදර්ශයේ උත්තරීතර පිළිබිඹුව වූ රන්මලි මා අසල සිටී. සිය මුග්ධ කාම ආශාවෙන් පෙලෙන ජයනාත් වැනි බල්ලෝද තවමත් කඳු පාමුල සිට සදවතියට උඩු බුරයි.

අද මම සියයට සියයක්ම නිරෝගී සුවයෙන් ඉන්නවා. ආපසු හැරිලා බලද්දිවත් මේ රෝගී තත්ත්වයන් සම්බන්ධයෙන් වේදනාත්මක හැඟීමක් මට ඉතිරිවෙලා නෑ. මොළයේ කරන ලද අතිශය අවදානම් සැත්කමකට පසුව පියයුරු පිළිකාවකටද සාර්ථකව මුහුණ දුන් ස්වරණා සිය අභියෝගාත්මක අත්දැකීම් නිහතමානීව සමාජය දැනුවත් කරයි. ජීවිත අභියෝග හමුවේ ඇය එඩිතර මෙන්ම බුද්ධිමත් යයි මට සිතේ. ඩපිඩිකාවඩ කියන රෝගී තත්ත්වය ඇසුණත් අපේ හිතට දැනෙන්නේ මරණයේ වේදනාවය. ඊට නොදෙවැනි තරමට පිළිකා තත්ත්වයකින් ගැලවීමට දරන සෑම වෑයමකටම අතිවිශාල වියදමක්ද දරන්නට සිදුවේ. මේ සියල්ල ඇයටද නොදැණුනා නොවේ.

නරේන්ද්‍රා, ඔබේ මවගේ අගය මිල කල නොහැකිය.
බස්සා තටු සලන්නේ ගොම්මනේදී බව ඇය තදින් මට කියයි.

"සුබ සන්ධ්‍යාවක් ආර්යාවෙනි"



සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන
තිසර ගුවන්විදුලිය www.thisara.com

FOR ALL YOUR TRANSLATIONS
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)

(ENGLISH SINHALESE)
Documents for immigration purposes

- BIRTH , MARRIAGE, DEATH
- EDUCATIONAL/ VOCATIONAL
- LEGAL and POLICE DOCUMENTS
- NATIONAL IDENTITY CARDS

CONTACT
DR. PREMA KUDALIGAMA
(BA, PGDE, M.A. Ph.D (Edu.)
NAATI Level 3 (Interpreting & Translating)

Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premaku@bigpond.com